# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## සංස්කෘතිය සහ සාරධර්ම ගොඩනැඟීම සඳහා වූ ශ්‍රී ලංකා සංස්කෘතික පදනම (සංස්ථාගත කිරීමේ)

**සංස්කෘතිය සහ සාරධර්ම ගොඩනැඟීම සඳහා වූ ශ්‍රී ලංකා සංස්කෘතික පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

හම්බන්තොට දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු දිලිප් වෙදආරච්චි මහතා විසින් 2013 ජුනි මස 06 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2013 මැයි මස 27 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[248 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 8.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

2—PL 007325—750 (2013/06)

# සංස්කෘතිය සහ සාරධර්ම ගොඩනැඟීම සඳහා වූ ශ්‍රී ලංකා සංස්කෘතික පදනම (සංස්ථාගත කිරීමේ)

## සංස්කෘතිය සහ සාරධර්ම ගොඩනැඟීම සඳහා වූ ශ්‍රී ලංකා සංස්කෘතික පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

"සංස්කෘතිය සහ සාරධර්ම ගොඩනැඟීම සඳහා වූ ශ්‍රී ලංකා සංස්කෘතික පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක් එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එකී පදනමට සම්බන්ධ සියලු කරුණු හා පරමාර්ථ ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබුණු හෙයින් ද:

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී පදනම සංස්ථාගත කිරීමට ඉල්ලීමක් කර ඇති හෙයින් ද, එම ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 2013 අංක  දරන සංස්කෘතිය සහ සාරධර්ම ගොඩනැඟීම සඳහා වූ ශ්‍රී ලංකා සංස්කෘතික පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

සංස්කෘතිය සහ සාරධර්ම ගොඩනැඟීම සඳහා වූ ශ්‍රී ලංකා සංස්කෘතික පදනම සංස්ථාගත කිරීම.

2. (මෙහි මින් මතු "පදනම" යනුවෙන් හඳුන්වනු ලබන) සංස්කෘතිය සහ සාරධර්ම ගොඩනැඟීම සඳහා වූ ශ්‍රී ලංකා සංස්කෘතික පදනමේ සාමාජිකයන් වශයෙන් දැනට සිටින තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින්මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කර ගනු ලබන තැනැත්තන්, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව "සංස්කෘතිය සහ සාරධර්ම ගොඩනැඟීම සඳහා වූ ශ්‍රී ලංකා සංස්කෘතික පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "සංස්කෘතිය සහ සාරධර්ම ගොඩනැඟීම සඳහා වූ ශ්‍රී ලංකා සංස්කෘතික පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් බවට පත්වන්නේ ය. තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණ වල නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

2—PL 007229—75 (2013/05)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) මිනිසාට විඳීමට සිදුවන දුක්ඛිත තත්ත්වයන් වළක්වාලීමේ සහනසේවා කාර්යයන් කිරීම සඳහා සාමාජික සංවිධාන ධෛර්යවත් කිරීම සහ පෙළඹවීම;

(ආ) සෑම රටක් තුළම සංස්කෘතික සේවා සඳහා වූ සංගමයක් පිහිටුවීම හා වර්ධනය කිරීම, ඒ සඳහා දිරිදීම සහ ප්‍රවර්ධනය කිරීම සහ එම සංවිධාන තුළ ප්‍රධාන සංවිධානයේ ප්‍රතිපත්ති ප්‍රතිෂ්ඨාපනය කිරීම;

(ඇ) ජාතික, ජාත්‍යන්තර හා ප්‍රාදේශීය මට්ටමේ පූර්ව මට්ටමින් ව්‍යසන පෙර සූදානම් ව්‍යාපෘති නිර්මාණය කිරීම හා ඊට සහාය වීම;

(ඈ) සමාජ සේවා සංස්කෘතික ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ද, පෞරුෂ වර්ධනය සඳහා ද අවශ්‍ය සම්පත් සම්පාදනය කිරීම සහ යෙදවීම;

(ඉ) සියලු ජාතීන්ට එක ලෙස සැලකීම, ඔවුන්ගේ සංස්කෘතියට ගරු කිරීම, වැරදි දිසාවන්ට ගමන් කරන සියලුම කලාකරුවන් යහපත් අයුරින් ආරක්ෂා කිරීම හා සංවිධානයට හැකි අයුරින් ඔවුනට සහනසේවා සැපයීම;

(ඊ) සංස්ථාවේ පොදු පරමාර්ථවලට අනුකූලවද, ජාතික සංගම් හා සාමාජික සංගම් සමඟ සහයෝගිතාවෙන්ද යුතුව ජාත්‍යන්තර සහන සේවා ක්‍රියාකාරකම් සංවිධානය කිරීම සම්බන්ධීකරණය කිරීම හා මෙහෙයවීම;

(උ) ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් කාර්යක්ෂම සංවිධාන ව්‍යුහයන් සහ තොරතුරු බෙදා හැරීමේ යටිතල පහසුකම් ඇති කිරීම;

(ඌ) ජාත්‍යන්තර, ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් වෙසෙන දක්ෂ නිර්මාණශීලී කලාකරුවන් සඳහා කුසලතා සහතික පත්,

දිරිගැන්වීමේ සහතිකපත්, සම්මාන, දිරිගැන්වීමේ සම්මාන, ගෞරව සම්මුති ප්‍රදානය කිරීම, කලාකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ඔවුනට ඒ සඳහා අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීම හා අඛණ්ඩව එය පවත්වා ගෙන යෑම;

(එ) සමාජ සංස්කෘතික සේවා සඳහා පදනමේ සාමාජිකත්වය දරන සාමාජිකයන් සඳහා හැඳුනුම්පතක් නිකුත් කිරීම හා ඔවුනට අභිමානවත් පුරවැසියකු ලෙස කටයුතු කිරීමට ශක්තිය ලබා දීම;

(ඒ) ජාතික සංවිධාන හා ප්‍රාදේශීය සංවිධාන සමඟ සංස්කෘතික වැඩසටහන් පැවැත්වීම හා වෙබ් අඩවියක් පිහිටුවා පවත්වාගෙන යෑම;

(ඔ) දානපතියන්ගේ සහයෝගය ලබා ගැනීම, ඔවුන්ගේ ආධාර උපකාර ඇතිව වෙනත් සංවිධාන සමඟ සම්බන්ධතා වර්ධනය කර ගැනීම;

(ඕ) සාමාජික සංවිධාන අතර මිත්‍රත්වය, අන්තර් ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කරමින් එකී සංගම් අතර සම්බන්ධීකරණය ඇති කිරීම;

(ක) විවිධත්වයේ ජන කොටස් සඳහා මිනිස්කමේ වැදගත්කම වටහා දීම, සංස්කෘතියෙන් අප රටේ පෙර ශ්‍රී විභූතිය නැවත මතු කොට පෙන්වීම හා ඒ මඟින් යහපත් සමාජයක් ගොඩනැඟීමට දායක වීම;

(ග) උචිත සෑම අවස්ථාවකදීම මානව හිතවාදී නීති සම්පාදනය කිරීම, ප්‍රවර්ධනය කිරීම හා ප්‍රචලිත කිරීම සඳහා රජයට කරුණු ඉදිරිපත් කිරීම; සහ

(ට) ඉහත සඳහන් පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා අවශ්‍ය හිතකර හෝ ආනුෂංගික වන හෝ විය හැකි වෙනත් ක්‍රියා හා දේ කිරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**4.** (1) සංස්ථාවේ කටයුතු සභාපති /අධ්‍යක්ෂ ජනරාල්, පරිපාලන ලේකම්, ජ්‍යෙෂ්ඨ උපසභාපති, උප සභාපති, ප්‍රාදේශීය සංවිධායක සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් යන අයගෙන් සමන්විත වූ උත්තරීතර කමිටුවක් විසින්, මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව, කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද නිමල් චන්දන වීරතුංග මහතා සංස්ථාවේ යාවජීව අධ්‍යක්ෂ ජනරාල්වරයා විය යුතු අතර, ඔහුගෙන් පසු අධ්‍යක්ෂ ජනරාල් ධුරයට ඔහුගේ අනුප්‍රාප්තිකයා ඔහු විසින් නම් කරනු ලැබිය යුතු ය. එසේ අනුප්‍රාප්ත වන අධ්‍යක්ෂ ජනරාල්වරයා ද යාවජීව අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් වන්නේ ය.

සංස්ථාවේ බලතල.

**5.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව:—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා මුදල් ණයට ගැනීමට හෝ ලබා ගැනීමට;

(ආ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගණුදෙනු කළ හැකි සාධන පත්‍ර සෑදීමට, ලිවීමට, භාර ගැනීමට, වට්ටම් දීමට, ගණුදෙනු කිරීමට, මිලට ගැනීමට, විකිණීමට, නිකුත් කිරීමට සහ බැංකු ගිණුම් විවෘත කිරීමට ක්‍රියාත්මක කිරීමට සහ වැසීමට;

(ඇ) සංස්ථාවේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් සභාව විසින් සුදුසු යයි සලකනු ලබන ආකාරයකින් ආයෝජනය කිරීමට;

(ඈ) දායක මුදල්, සම්මාදම්, ප්‍රදානයන්, පරිත්‍යාග සහ සියලු වර්ගවලට අයත් ත්‍යාග ඉල්ලා සිටීමට සහ භාර ගැනීමට;

(ඉ) යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් සමඟ ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්තුවලට එළැඹීමට;

(ඊ) යම් නිශ්චල දේපළකට හෝ පෞද්ගලික දේපළකට බලපාන කොන්දේසි භාර ගැනීමට, පිළිගැනීමට, ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ පරිපාලනය කිරීමට;

(උ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීමට, සේවයෙහි නියුක්ත කිරීමට, සේවයෙන් පහ කිරීමට හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීමට සහ සංස්ථාව විසින් තීරණය කරනු ලබන යම් වැටුප්, දීමනා සහ පාරිතෝෂික ඔවුන්ට ගෙවීමට;

(ඌ) සංස්ථාවේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයන්හි දී සේවක පිරිස් පුහුණු කිරීමට; සහ

(එ) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ අවස්ථානුකූල වෙනත් සියලු දේ කිරීමට.

සංස්ථාවට බලය ඇත්තේ ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින් සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, පහත දැක්වෙන සියලු කාරණා සඳහා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, එක් එක් පන්තියට අයත් සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු, ඔවුන් ඇතුළත් කර ගැනීම, ඔවුන් නෙරපීම හෝ ඔවුන්ගේ ඉල්ලා අස්වීම;

(ආ) උත්තරීතර කමිටුව තෝරා පත්කර ගැනීම, ඔවුන්ගේ අස්වීම, ධුර අත් හැරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ උත්තරීතර කමිටුවේ බලතල, කාර්ය සහ ක්‍රියා කලාපය;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන් සේවයෙන් පහකිරීම, ඔවුන්ගේ බලතල, කාර්ය, කර්තව්‍ය සහ චර්යාව;

(ඇ) උත්තරීතර කමිටුවේ, සංස්ථාවේ හෝ යම් අනුකාරක සභාවක රැස්වීම්වල දී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම, පූරප්පාඩු පිරවීම, රැස්වීම් පිළිබඳ දැන්වීම් සහ න්‍යාය පත්‍ර, ගණපූරණය සහ ඒ රැස්වීම්වල දී කටයුතු කරගෙන යෑම;

(ඉ) කමිටුවේ සහ සංස්ථාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් සහ නුසුදුසුකම්; සහ

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම හා එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී පැවැති පදනමේ රීති, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවනතාක් දුරට සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු අතර, එම රීති මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලබන ආකාරයෙන් එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සියළුම සාමාජිකයන් සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත් විය යුතු ය.

පදනම විසින් ගෙවිය යුතු හා පදනමට අය විය යුතු ණය.

7. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ පවත්නා සියලුම ණය සහ බැරකම්, මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථව විසින් ගෙවනු ලැබිය යුතු අතර, පදනමට අය විය යුතුව තිබුණු සියලුම ණය සහ දායක මුදල් හා ගාස්තු මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

8. යම් මිලට ගැනීමක්, තෑග්ගක්, ප්‍රදානයක් හෝ තෙස්තමේන්තු නියාදනයක් (නිවේදනයක්) ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව වෙත පවරනු ලබන යම් නිශ්චල හෝ චංචල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට සංස්ථාවට බලය හා හැකියාව ඇති

අතර, ඒ දේපළ උකස් කිරීම, බදු දීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම සඳහා සම්පූර්ණ බලය සහිතව, 6 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් දරනු ලැබිය යුතුය. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයේ දී පදනමට අයත්ව තිබූ සියලු දේපළ සංස්ථාව වෙත සතු කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**9.** (1) සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු ය.

(2) සංස්ථාව සඳහා සහ වෙනුවෙන් භාර ගනු ලබන ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, සම්මාදම් මුදල් දායක මුදල් ගාස්තු හෝ ප්‍රධාන වශයෙන් ලැබෙන සියලු මුදල් උත්තරීතර කමිටුව විසින් තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ ගිණුම් විගණනය කිරීම.

**10.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාවේ ආදායම සහ වියදම ද, වත්කම් සහ බැරකම් සහ අනෙකුත් සියලු ම ගණුදෙනු පිළිබඳව නිසි ගිණුම් පවත්වා ගෙන යාමට සංස්ථාව කටයුතු කළ යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා", යන්නෙන්,—

(1) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් ස්ථාපිත වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(2) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් ස්ථාපිත වෙනත් යම් ආයතනයක සාමාජිකයන් වන එකී ආයතනයේ එක් එක් නේවාසික හවුල්කරුවන්

සහිත ගණකාධිකාරි පාලක මණ්ඩලය විසින් ගණකාධිකාරි වරයකු ලෙස වෘත්තීය සඳහා නිකුත් කළ සහතිකයක් සන්තකයේ ඇති ව්‍යාපාර ආයතනයක්,

අදහස් කෙරේ.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

11. තත්කාලයේ බලාත්මකව පවත්නා ආයතනයේ රීතිවල දැක්වෙන විධිවිධානවල නියම කර ඇති තැනැත්තන් සංඛ්‍යාවක් ඉදිරිපිට මිස ආයතනයේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට බාහිරව විය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපළ.

12. සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වුවහොත් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, ආයතනයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර, බෙදා දීම, තහනම් කරනු ලබන්නා වූ ද වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එම ආයතනය කවරේදැයි සංස්ථාව විසුරුවා හරින අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුවම හෝ සංස්ථාවේ සාමාජිකයන් විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

13. මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මඟින් ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන වෙනත් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

14. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.